සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය

නිවිතිගල අධ්‍යාපන කලාපය ( සැකසුම - ඩබ්. චන්ද්‍රිකා සමරසිංහ )

නොවැම්බර් මාසය -4 සතිය 19 පාඩම - <u>රස විඳිනා දැනුම මනා</u>

1)යා කරන්න

| | |
|---|---|
| දෘශ්‍ය කාව්‍යයකි | කාව්‍ය ප්‍රභේද තුන |
| රසවත් කියමන | භාෂාව |
| තාලයකට කියවිය හැකි ය | නාට්‍ය |
| ගද්‍ය , පද්‍ය , දෘෂ්‍ය | කාව්‍යයකි |
| සාහිත්‍යයේ මාධ්‍යය | පද්‍ය |

2)පෙළ පොතේ 180 පිටුව කියවා මෙහි හිස්තැන පිරවීමට උත්සාහ කරන්න

අද්දැකීම් , සාහිත්‍යෝචිත අමු ද්‍රව්‍ය = මෝටර් රථ කොටස් ගබඩාවක්

දැනුම හා පරිචය ඇත්තෙකු මෝටර් රථයක් තැනීම = ............................................

3)හිස්තැන් පුරවන්න

1.උසස් නිර්මාණයක් බිහි කිරීමට නිර්මාණකරුවා තුළ මනා ................ ශක්තියක් තිබිය යුතු ය.

2.ලේඛකයා තම අද්දැකීම් .......... කරන්නේ සාහිත්‍ය නිර්මාණයකිනි. 3. සාහිත්‍ය නිර්මාණයක් සඳහා විවිධ ....... යොදා ගනියි.

4. .... ක්‍රමය යනු අන්තර්ගතය ඉදිරිපත් කරන්නේ කවුරුන් ද යන්නයි.5.ශ්‍රේෂ්ඨ කවියා අරමුණට උචිත ..... නිර් මාණය සඳහා යොදා ගනියි.

6.කලා කෘතියක අරමුණ .......... නිෂ්පත්තියයි. (අන්තර්ගතය , ආකෘති , ප්‍රතිනිර් මානය , දැනුම , කථන , පරිකල්පන )

4) මෙම ගීතය පිළිබඳ රසවිඳීමක් කරන්න.


මගෙ දුවේ ඔබ අවදියෙන් නම්..
මේ රැයේ මිහිරිම වෙලාවයි
දොර ඇරන් එළියට ආවොතින්..
මේ මිහිරි දේවල් නුඹටමයි

සේපාලිකා මල් බිමට බැහැලා
ඇවිදින්න යන වෙලාවයි

නිල් තාරකා බිම බලාගෙන
වැව් දියට පෙම් බැඳී වෙලාවයි
මේ පොළොව කෙතරම් සුන්දරද
මගෙ දූත් තනියෙම හිනාවෙයි

මගෙ දුවේ ඔබ අවදියෙන් නම්..
මේ රැයේ මිහිරිම වෙලාවයි
දොර ඇරන් එළියට ආවොතින්..
මේ මිහිරි දේවල් නුඹටමයි

ගන කළුවරට අප පෙම් කලොත්
ඉර හඳ තරුවලට ණය ගැතියි

ලොව දුන්නු දේවල් අද අපිට
හෙට ලොවට පෙරලා දිය යුතුයි
ඔබ මේ ලොවට ආදරේ නම්
මුළු ලොවම ඔබටත් ආදරෙයි

මගෙ දුවේ ඔබ අවදියෙන් නම්..
මේ රැයේ මිහිරිම වෙලාවයි
දොර ඇරන් එළියට ආවොතින්..
මේ මිහිරි දේවල් නුඹටමයි...

5) පහතින් දැක්වෙන්නේ දැසේ නිල් පැහැය හා දිවිහ දාන යන සාහිත්‍ය නිර්මාණවල කතුවරුන් යොදා ගෙන ඇති උපක්‍රම කිහිපයකි. ඒවාට උදාහරණ එම නිර්මාණවලින් උපුටා දක්වන්න.

1.භාෂාව - කටවහර - ..........................................................................................................................

- ලේඛන වහර - ..........................................................................................................................

2.රූපකාර්ථවත් යෙදුම් - ..........................................................................................................................

3.කාව්‍යෝක්ති - ..........................................................................................................................

4.උපමා - ..........................................................................................................................

5.සමබර චරිත නිරූපනය - ..........................................................................................................................

6)“සමාජ පෙරළියක් සිදු කළ හැකි අපේ ගීත කලාව” මැයෙන් රචනයක් ලියන්න. සැ.යු.